සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Department of Education - Sabaragamuwa Province

# මධ්‍යවාර පරීක්ෂණය - 2021

**7 ශ්‍රේණිය** **ඉතිහාසය** කාලය පැය 02

නම ඃ- .................................... විභාග අංකය ඃ- ......................

සැකසුම- ඩී.එල්.ඩී.කෞශල්‍යා

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා වඩාත් සුදුසු පිළිතුර තෝරා ඉරක් අඳින්න.

1) හෝපිටුගමුව ටැම් ලිපිය පිහිටුවන ලද රජතුමා වන්නේ,

   i) IV උදය රජු
   ii) I උදය රජු
   iii) IV මහින්ද රජු
   iv) II සේන රජු

2) අතීතයේ අශ්වයින් පිළිබඳව කාර්යංශයේ ප්‍රධානියා වන්නේ,

   i) අශ අදෙන
   ii) රූප අදෙන
   iii) අති අදෙන
   iv) බතගු

3) පාන්ඩ්‍ය දේශයේ අගනුවර කුමක්ද?

   i) කාංචි පුරය
   ii) තංජෝරය
   iii) මදුරාපුරය
   iv) අනුරාධපුරය

4) කිසියම් රටක ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන ලෝක උරුම ලෙස නම් කරන සංවිධානයකි.

i) ලෝක පරිසර සංවිධානය

ii) රතුකුරුස සංවිධානය

iii) ලෝක සෞඛ්‍ය සංවිධානය

iv) යුනෙස්කෝ සංවිධානය

5) පරාක්‍රම සමුද්‍රය කරවන රජතුමා වන්නේ,

i) මහසෙන් රජු

ii) පරාක්‍රමබාහු රජු

iii) ධාතුසේන රජු

iv) වසභ රජු

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා හරි නම් ✓ ලකුණ ද වැරදි නම් x ලකුණ ද යොදන්න.

6) තමාට කළ උපකාරයට ප්‍රතිඋපකාර සපයන ක්‍රමය "අත්තම්" ක්‍රමය ලෙස හැඳින් වේ. ( )

7) පළමුවන විජයබාහු රජතුමා කාලිංග දේශයේ තිලෝක සුන්දරී විවාහ කර ගන්නා ලදී. ( )

8) ධාතුසේන රජතුමා ලම්භකර්ණ පෙළපතේ ප්‍රථම පාලකයාය. ( )

9) දළදා මාළිගය ලංකාවේ පිහිටි ලෝක උරුමයකි.( )

10) ක්‍රි.ව. 1215 දී පොළොන්නරුව ආක්‍රමණය කළේ පාණ්ඩයන් විසින් ය.( )

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවරැදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

11) අනුරාධපුර යුගයේ සිට ................ රජු තම මවට දිවා රාත්‍රී උපස්ථාන කළ බව මහා වංශයේ සඳහන් ය. ( අටවන අග්ගබෝධි /මානවම්ම)

12) II වන සේන රජු ආක්‍රමණය කළේ...............දේශයයි.(පාණ්ඩ්‍ය/පල්ලව )

13) අතීතයේ ගම් පාලනය කළේ.............(ගමික/ගහපති) ය.

14) මෙහෙන්දජාරෝ හරප්පා නගරය ................පිහිටා ඇත.(ඉන්දියාව /පාකිස්ථානය)

15) ග්‍රීක ශිෂ්ටාචාරය ඇතිවීමට පෙර එහි පැවති ශිෂ්ටාචාරය (රොමියුලස්/මිනෝවන්)

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා හිස්තැන් පුරවන්න.

16) ශ්‍රමයට ශ්‍රමය ලබා දීමේ ක්‍රමය ..........................වේ.

17) නිශ්ශංකමල්ල රජු කරවූ ලිපිය .......................වේ.

18) සීගිරිය නිර්මාණය කරන ලද රජතුමා .......................ය.

19) ඔලිම්පික් ක්‍රීඩාව ආරම්භ කළේ ..........................විසින් ය.

20) ජේසුස් වහන්සේගේ උත්පත්තිය සිදු වූයේ ................දීය.

II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පහත ස්ථාන ලංකා සිතියමක ලකුණු කරන්න.

1)

අ)

1. පොළොන්නරුව
2. යාපහුව
3. ගම්පොළ
4. කෝට්ටේ
5. මහවැලි ගඟ
6. අනුරාධපුරය
7. දඹදෙනිය

(ල.07)

ආ)



1. මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2. මෙම නිර්මාණය අයත් වන්නේ කුමන ශිෂ්ටාචාරයටද?

(ල.02 ½ )

ඇ)

1. මෙම රූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක්ද?



2. මෙය පිහිටා ඇති ඓතිහාසික නගරය කුමක්ද?

(ල.02 ½ )

2) අතීතයේ හේන්වල වගා කළ වී ඇල් වී ලෙස හඳුන්වයි.

1. හේන්වල වගා කරන ලද ඇල් වී වර්ග තුනක් සඳහන් කරන්න.

(ල.03)

2. A. හේන්වල වගා කළ වෙනත් භෝග දෙකක් ලියන්න.

B.අස්වැන්න වැඩි කර ගැනීමට හේන් වගාවේදී අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(ල.04)

3. A. ලංකාව සමඟ වෙළඳ සම්බන්ධතා පැවැත්වූ රටවල් 3 නම් කරන්න.

B. විදේශයෙන් මෙරටට ගෙන්වා ගත් භාණ්ඩ වර්ග 2 නම් කරන්න.

(ල.05)

3)

1. අනුරාධපුර යුගයේ සමාජ සුභසාධනයට දායක වූ රජවරුන් 2 නෙක් නම් කරන්න.

(ල.02)

2. A.අනුරාධපුර යුගයේ මෙරට රාජ්‍යත්වය හිමි වූ ක්‍රම දෙකක් ලියන්න.

B. රාජ්‍ය පාලනයේ දී රජුට සහය වූ නිළධාරීන් 2 ක් නම් කරන්න.

(ල.04)

3. අනුරාධපුර යුගයේ රජවරුන් පාලනය සංවිධානය කළ ආකාරය පැහැදිළි කරන්න.

(ල.06)

4)

1. අනුරාධපුර අග භාගයේ ශ්‍රී ලංකාවට සෘජු බලපෑම් කළ දකුණු ඉන්දීය රාජ්‍යයන් 3 නම් කරන්න.

(ල.03)

2. A.පළමුවන විජයබාහු රජුගේ මව හා පියා නම් කරන්න.

B. විජයබාහු රජු ගැන තොරතුරු සඳහන් වන මූලාශ්‍ර දෙක නම් කරන්න.

(ල.04)

3. මහා පරාක්‍රමබාහු රජතුමා ජනතා සුබසාධනය සඳහා දායක වූ ආකාරය පැහැදිළි කරන්න.

(ල.05)

5)

1. අස්පෘෂ්‍ය උරුමයන් සඳහා උදාහරණ 3 ක් ලියන්න.

(ල.03)

2. සාම්ප්‍රදායික කලාශිල්ප හතරක් නම් කරන්න.

(ල.04)

3. පහත සඳහන් චාරිත්‍ර කුමන අවස්ථාවල භාවිත කරන ලද්දේද?

A ජාන කර්ම

B නාමකරණ

C කර්ණවේදය

D අන්තප්‍රාසාන

E විද්‍යාරම්භ

(ල.05)

6)

1. පොළොන්නරුව රාජධානියෙන් පසු බිහි වූ රාජධානි 3ක් නම් කරන්න.

(ල.03)

2. II වන පරාක්‍රමබාහු රජතුමාගේ සේවාවන් දෙකක් නම් කරන්න.

(ල.04)

3. හයවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය කාලය වැදගත් වන ආකාරය පැහැදිළි කරන්න.

(ල.05)

7)

1. ග්‍රීසියේ බිහි වූ දාර්ශනිකයන් 3 ක් නම් කරන්න.

(ල.03)

2. A. රෝම ශිෂ්ටාචාරයෙන් ලොවට දායාද කළ උරුම නම් කරන්න.

   B. ග්‍රීක පාලනයේ විශේෂ ලක්ෂණ 2 ක් නම් කරන්න.

(ල.04)

3. ඔගස්ටස් සීසර්ගේ වැදගත්කම පැහැදිළි කරන්න.

   (ල.05)